## මඩුල්ල ප්‍රාදේශීය සභාව

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 සැප්තැම්බර් 10 දිනද ,ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 අගෝස්තු 01 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 නොවැම්බර් 23 දින සභාවේ සභාපති වරයා වෙත යවන ලදී.

### 1.2 මතය

සභාපතිවරයා වෙත යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතු කොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති මඩුල්ල ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිලිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 නොසැසඳෙන පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 12 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.31,205,229 ක් වූ අතර, උපයෝගිලේඛන/වාර්තා අනුව රු.16,694,875 ක් විය.

#### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.63,236,059 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

### 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිලියෙල කර තිබූ අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තු කළ වියදම් හා තථ්‍ය වියදම් අතර 27% සිට 347% දක්වා වූ පරාසයක විචලනයක් පෙන්නුම් කෙරෙන බැවින් වියදම් පාලනයේදී අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස

යොදාගෙන නොමැති බැව් නිරීක්ෂණය විය.

## 2.2 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.2,087,097 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.459,063 ක් විය.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත රු. 000' | තථ්‍ය රු. 000' | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය රු. 000' |
|---|---|---|---|---|
| (i) | බදු කුලී | 2,369 | 2,805 | (436) |
| (ii) | බලපත්‍ර ගාස්තු | 220 | 109 | 111 |
| (iii) | වෙනත් ආදායම් | 1,247 | 1,266 | (19) |

### 2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 671,770 |
| (ii) | මුද්දර ගාස්තු | 491,340 |

### 2.3.3 කඩ කාමර කුලී

2011 දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කාමර කුලිය රු. 169,179 ක් විය.

## 2.4 අවිධිමත් ගනුදෙනු

ජල යෝජනා ක්‍රමයක් සඳහා රු.95,000 ක වටිනාකමට මෝටරයක් සහ ඊට අදාල උපාංග සමාලෝචිත වර්ෂයේදී මිල දී ගැනීමේදී මිල කැඳවීම් ලිපියේ පිරිවිතරයන් සඳහන් කර නොතිබූ අතර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.4 පරිදි තාක්ෂණික ඇගයීම් කමිටුවක තීරණය ලබා ගෙන නොතිබුණි.

## 2.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා

**පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.**

(අ) මඩුල්ල සතිපොල සංවර්ධන කාර්යය සඳහා මිලදී ගත් සිමෙන්ති මළු 60 ක්, 6"x9" සක්කගල් කියුබ් 5 ක්, 1" කොන්ක්‍රීට් ගල් කියුබ් 13 ක්, මි.මී. 10 දහර වානේ කම්බි 10 ක් හා බඳින කම්බි කි.ග්‍රෑ. 4 ක් සභාවේ මන්ත්‍රීවරයෙකු විසින් පෞද්ගලික අවශ්‍යතාවයක් සඳහා ගෙන ගොස් තිබූ බව කාර්මික නිලධාරී විසින් වාර්තා කර තිබුණි. මෙම ද්‍රව්‍ය වල වටිනාකම අයකර ගැනීමට කටයුතු කරන බව සභාපති 2011 නොවැම්බර් 29 දින මා වෙත වාර්තා කර තිබුණි .

(ආ) රු.541,035 ක් වූ මිලදී ගැනීම් තොග ලේඛනයක ඇතුලත් කර නොතිබුණි.

(ඇ) 2011 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය හා අත්තිකාරම් ශේෂවල එකතුව රු.186,119 ක් වූ අතර අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි ගිණුම් ශේෂවල එකතුව රු.59,306 ක් විය.

## 3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) අභ්‍යන්තර පාලනය